- ***<u>සුරේෂ් සලේ රණවිරුවාගේ රැඳවුම් නියෝග 28න් පසු දීර්ඝ නොකරන්නැයි, රණවිරුවන්ට සාධාරණය ඉටුකරන්නැයි, බිරිඳට හා දරුවන්ට මානව අයිතාවාසිකම් ඉටුරන්නැයි ජා: නි: පෙ: ජනපතිගෙන් ඉල්ලයි…</u>***
- ***<u>පලෙයි රක්ෂිතයේ එල්.ටී.ටී.ඊ. කඳවුර ගැන හෙළිකළ සංගීත් ජයසේකර අත්අඩංගුවට… එම වරදම කළ දෙමළ දේශපාලනඥයන් නිදැල්ලේ… ආණ්ඩුවේ දෙබිඩි නීතිය හෙළිවේ…</u>***
- ***<u>22 වැනි ව්‍යවස්ථා සංශෝධනය හේතුවෙන් ආන්ඩුව ඇතුළේත් බරපතළ අර්බුද…</u>***

හිටපු රාජ්‍ය බුද්ධි අංශ ප්‍රධානී මේජර් ජෙනරාල් සුරේෂ් සලේ මහතා අසාධාරණ ලෙස රැඳවුම් නියෝග මත රඳවාගෙන සිටීම, ඔහුට එල්ල වී ඇති අමානුෂික අඩන්තේට්ටම් සහ වත්මන් ආණ්ඩුව නීතිය ක්‍රියාත්මක කිරීමේදී සිංහල බෞද්ධයන්ට එක් ආකාරයකිනුත්, දෙමළ හා අන්‍ය පාර්ශ්වයන්ට තවත් ආකාරයකිනුත් සලකන දෙබිඩි පිළිවෙත පිළිබඳව ජාතික නිදහස් පෙරමුණ දැඩි විරෝධය පළ කරයි.

කොළඹදී පැවති විශේෂ මාධ්‍ය හමුවක් අමතමින් ජාතික නිදහස් පෙරමුණේ දේශපාලන මණ්ඩල සභික සඳුන් බණ්ඩාර බෝදරගම මහතා අවධාරණය කළේ, මෙරට බෙදුම්වාදී යුද්ධය නිමා කිරීම සඳහා අමිල මෙහෙවරක් ඉටුකළ විශිෂ්ට රණවිරුවෙකු වන සුරේෂ් සලේ මහතා දින 180කට ආසන්න කාලයක් අසාධාරණ ලෙස රඳවා තබාගනිමින් සිදුකරන දඩයම වහා නතර කළ යුතු බවයි.

**එහිදී අදහස් දැක්වූ සඳුන් බණ්ඩාර මහතා මෙසේද පැවසීය:**

"හිටපු රාජ්‍ය බුද්ධි අංශ ප්‍රධානී සුරේෂ් සලේ මහතා අත්අඩංගුවට ගැනුණේ කුප්‍රකට එල්.ටී.ටී.ඊ. හිතවාදී චැනල් 4 නාලිකාවට රටින් පැනගිය අසාත් මවුලානා නමැති පුද්ගලයා කළ ප්‍රකාශයක් මත පමණයි. අද වනතුරු ඔහුට එරෙහිව කිසිදු නීතිවිරෝධී ක්‍රියාවක් ඔප්පු වී නැහැ. නමුත් මාස 6කට ආසන්න කාලයක් ආරක්ෂක අමාත්‍යවරයාගේ රැඳවුම් නියෝග මත ඔහුව රඳවාගෙන සිටිනවා. මෙම කාලය තුළ ඔහු අමානුෂික වදහිංසාවලට ලක්වූ බව ඔහුගේ බිරිඳ හෙළි කළා. අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුව මුලදී එය ප්‍රතික්ෂේප කළත්, අනෙකුත් සිරකරුවන් ඉදිරියේ ඔහුව නිරුවත් කර ගුද මාර්ගය පරීක්ෂා කළ බව පසුව පිළිගත්තා.

මේ අඩන්තේට්ටම් හමුවේ එතුමා උපවාසයක් ආරම්භ කළ අතර පසුව රෝහල්ගත කෙරුණා. මේ වනවිට එතුමා හදවත් සැත්කමකටද ලක්ව සෞඛ්‍ය තත්ත්වය අතිශය බරපතළ මට්ටමක පවතිනවා. එතුමාගේ බිරිඳ මේ වනවිටත් ජනාධිපතිවරයාගෙන් දෙවරක් ඉල්ලා තිබෙන්නේ රැඳවුම් නියෝගවලින් නිදහස් කර ඔහුව රක්ෂිත බන්ධනාගාරගත කරන ලෙසත්, පරීක්ෂණ සඳහා පූර්ණ සහයෝගය ලබාදෙන බවත්ය. එළඹෙන 28 වනදාට මෙම රැඳවුම් නියෝග යළි දීර්ඝ කිරීමට නියමිතයි. රට වෙනුවෙන් දිවි පරදුවට තබා ක්‍රියාකළ මේ අභීත රණවිරුවා තවදුරටත් පළිගැනීමට ලක් නොකර, 28 න් පසු එම රැඳවුම් නියෝග අත්සන් නොකර ඔහුට සාධාරණය හා නිදහස ලබාදෙන ලෙස අපි ජනාධිපතිවරයාගෙන් ඉතා ගෞරවයෙන් ඉල්ලා සිටිනවා.''

එමෙන්ම රට තුළ නීතිය ක්‍රියාත්මක කිරීමේදී පවතින ජාතිවාදී හා දෙබිඩි ස්වභාවය පෙන්වා දෙමින් ඔහු මෙසේද සඳහන් කළේය:

"පසුගියදා සංගීත් ජයසේකර මහතා ප්‍රකාශයක් කළා පලෙයි රක්ෂිතය තුළ එල්.ටී.ටී.ඊ. කඳවුරක් සහ බහුමහල් ගොඩනැගිල්ලක් පවත්වාගෙන යන බවට. කැබිනට් මාධ්‍ය ප්‍රකාශකවරයා පසුව පිළිගත්තා එහි රක්ෂිත භූමිය නීතිවිරෝධීව එළිපෙහෙළි කර ඇති බවත්, අධිකරණ තහනම් නියෝග පවා නොතකා එය පවත්වාගෙන යන බවත්. එහෙත් අවසානයේ සිදුවූයේ කුමක්ද? රක්ෂිතය විනාශ කළ අයට එරෙහිව නීතිය ක්‍රියාත්මක කරනවා වෙනුවට, ජාතිවාදය ඇවිස්සූ බව පවසමින් සංගීත් විජේසේකර මහතාව අත්අඩංගුවට ගත්තා.

නමුත් එම කාලසීමාවේදීම දෙමළ ජාතික මහජන නියෝජිතයෙකු ප්‍රසිද්ධ මාධ්‍ය හමුවේ ප්‍රකාශ කළා 'දෙමළ ජනතාවගේ මළසිරුරු පන්සල් සහ හමුදා කඳවුරු තුළ වළදමා තිබෙනවා' කියා. එය ජාතිවාදය ඇවිස්සීමක් සහ බරපතළ අසත්‍ය ප්‍රකාශයක් නොවේද? එහෙත් එම දෙමළ නියෝජිතයාව අත්අඩංගුවට ගැනීම තබා, අඩුම තරමේ ප්‍රශ්න කිරීමක්වත් කිරීමට පොලිසිය හෝ ආරක්ෂක අංශ ඉදිරිපත් වුණේ නැහැ. සංගීත් විජේසේකර සිංහලයෙකු වූ නිසා අත්අඩංගුවට ගෙන, අන්‍ය ජාතික හා අන්‍යාගමික නියෝජිතයන් රටේ ඒකීයභාවයට සහ හමුදාවට එරෙහිව මෙවැනි අසත්‍ය චෝදනා නගද්දී නිහඬව සිටින්නේ ඇයි? සිංහල බෞද්ධයන් පමණක් ජාතිවාදීන් ලෙස හංවඩු ගසා දඩයම් කරන මේ ආණ්ඩුවේ දෙබිඩි පිළිවෙත කුමක්දැයි අපි ප්‍රශ්න කරනවා."

තවදුරටත් අදහස් දැක්වූ සඳුන් බණ්ඩාර මහතා පෙන්වා දුන්නේ, මෙම සියලු ක්‍රියාමාර්ග සහ 22 වැනි ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනය හරහා අභියාචනාධිකරණය පළාත් මට්ටමින් පිහිටුවීමට දරන උත්සාහයන් පිටුපස ඇත්තේ රට බෙදුම්වාදය කරා ගෙන යාමේ සහ එදා ඉතියෝපියාවෙන් එරිත්‍රියාව වෙන් කළාක් මෙන් ශ්‍රී ලංකාව දෙකඩ කිරීමේ අධිරාජ්‍යවාදී සහ ඩයස්පෝරා න්‍යායපත්‍රයක් බවයි.

එබැවින් මෙම අනතුර තේරුම් ගෙන රටේ ස්වෛරීභාවය හා රණවිරුවන් ආරක්ෂා කරගැනීමට සියලු ජනතාව පෙරමුණ ගත යුතු බවද හෙතෙම අවධාරණය කළේය

***<u>මම සඳුන් බණ්ඩාර බෝදරගම මහතා</u>***

***<u>එහිදී කළ සම්පූර්ණ දේශනය මෙසේය...</u>***

මම සඳුන් බණ්ඩාර බෝදරගම, දේශපාලන මණ්ඩල සභික, ජාතික නිදහස් පෙරමුණ. විශේෂයෙන්ම අද දවසේ විශේෂ කාරණා කිහිපයක් පිළිබඳව ජාතික නිදහස් පෙරමුණේ මතය ප්‍රකාශ කිරීම සඳහා තමයි අද දවසේ මේ මාධ්‍ය හමුව කැඳවන්නේ.

එක ප්‍රධාන කාරණයක් වෙන්නේ අපේ හිටපු රාජ්‍ය බුද්ධි අංශ ප්‍රධානී සුරේෂ් සලේ මැතිතුමා සම්බන්ධ වර්තමාන තත්ත්වය පිළිබඳවයි. අපි දන්නවා එතුමා සී.අයි.ඩී. (CID) එක මගින් අත්අඩංගුවට ගැනෙන්නේ ආරක්ෂක ඇමතිතුමාගේ නියෝගයක් මත. එතකොට එහෙම අත්අඩංගුවට ගත්තත් ඔහුට එරෙහිව අදටත් නීති විරෝධී කටයුත්තක් තියෙනවා කියලා නිශ්චිතව සඳහන් වෙන්නේ නැහැ. ඔහු අත්අඩංගුවට ගැනීමට ආසන්නතම හේතුව විදිහට කියවෙන්නේ කුප්‍රකට එල්.ටී.ටී.ඊ. වාදී චැනල් 4 නාලිකාවට අපේ රටේ වරෙන්තුකරුවෙක් වෙච්ච, අපේ රටෙන් පැනලා ගිහිල්ලා ඉන්න අසාත් මවුලානා කියන පුද්ගලයා කරපු ප්‍රකාශයක්. ඔහුගේ කතාව මත තමයි අපේ හිටපු රාජ්‍ය බුද්ධි අංශ ප්‍රධානී සුරේෂ් සලේ මැතිතුමාව අත්අඩංගුවට අරගෙන අද දක්වා දින 180කට ආසන්න කාලයක් රැඳවුම් නියෝග මත තියාගෙන ඉන්නේ.

එතකොට ඒ කාලසීමාව ඇතුළේ අපි දන්නවා ඔහුට විවිධ වූ වදහිංසාවන්ට ලක්වෙන්න වුණා කියලා ප්‍රසිද්ධ මාධ්‍යවල ප්‍රකාශයට පත්වුණා; ඔහුගේ ප්‍රකාශ තිබුණා. ඔහුගේ බිරිඳ විසිනුත් ප්‍රකාශයට පත් කළා. ඒ බොහොමයක් 'එහෙම නෙවෙයි' කියලා කියපු අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුව, අවසානයේ පිළිගත්තා ඔහු අනිත් සැකකරුවන් සහ සිරකරුවන් ඉදිරියේ නිරුවත් කරලා ඔහුගේ ගුද මාර්ගය පරීක්ෂා කරා කියලා. එවැනි බරපතළ අඩන්තේට්ටම්වලට ඔහු ලක් කළා කියා.

එතකොට එවැනි තත්ත්වයක් හමුවේ තමයි අවසානයේ එතුමා උපවාසයක් ආරම්භ කරන්නේ. පසුව එතුමා රෝහල්ගත වෙනවා. මේ වෙනකොට එතුමාගේ උපවාසය සහ ඒ රෝහල්ගත වීම ඇතුළේ එතුමාගේ සෞඛ්‍ය තත්ත්වය දැඩි ලෙස පිරිහිලා තියෙන්නේ. මේ වනවිට එතුමා හදවත ආශ්‍රිත ශල්‍යකර්මයකටත් ලක්වෙලා, එතුමා නිරෝගී නොවන තත්ත්වයක ඉන්නවා කියලා තමයි එතුමාගේ බිරිඳගේ පාර්ශ්වයෙන් කියවෙන්නේ. ඒ වගේම එතුමිය මේ වෙනකොට දෙවතාවක් ජනාධිපතිතුමාගෙන් ඉල්ලීම් කරලා තියෙනවා මෙතුමාව මේ සී.අයි.ඩී. භාරයෙන් නිදහස් කරන්න, රැඳවුම් නියෝගවලින් නිදහස් කරලා රක්ෂිත බන්ධනාගාරගත කරන්න කියලා. ඊට පස්සේ අවශ්‍ය පරීක්ෂණ කරගෙන යන්න, ඒ

සියලු පරීක්ෂණවලට සලේ මැතිතුමා සහ අනිත් සියලු දෙනා අවශ්‍ය සහයෝගය ලබාදෙනවා කියන කාරණය සඳහන් කළා.

එතකොට මෙවැනි ඉතාම සංවේදී කාරණයක් හමුවේ පවා අපි දකින්නේ නැහැ අද වෙනකන් ඒ ප්‍රශ්නයට නිශ්චිත පිළිතුරක්. ඉතින් අපි ඉතාම ගෞරවයෙන් ජනාධිපතිතුමාගෙන් ඉල්ලීමක් කරනවා, මේ මාසේ 28 වෙනිදා වෙනකොට මේ රැඳවුම් නියෝග නැවත දීර්ඝ කරන්න වෙනවා; ඒ සඳහා ඒ පැන පාවිච්චි කරන්න එපා කියන ඉල්ලීම අපි කරනවා. මොකද එතුමා අපේ රටේ අතිශය වැදගත් රණවිරුවෙක්; අපේ රටේ යුද්ධය අවසන් කිරීම වෙනුවෙන් විශේෂ දායකත්වයක් දක්වපු පුද්ගලයෙක්. එවැනි පුද්ගලයෙක් වෙනුවෙන් අවශ්‍ය සාධාරණ තීන්දු තීරණ ගන්න කියන ඉල්ලීම අපි කරනවා.

ඒ වගේම තවත් කාරණයක් තමයි, අපි දකිනවා පහුගිය දිනක සංගීත් ජයසේකර කියලා පුද්ගලයෙක් ප්‍රකාශයක් කරනවා පලෙයි කැලෑ රක්ෂිතය තුළ එල්.ටී.ටී.ඊ. කඳවුරක් ඉදිකරලා තියෙනවා, තට්ටු කිහිපයක ගොඩනැගිල්ලක් තියෙනවා, ඒ තුළ එල්.ටී.ටී.ඊ. පුහුණු කඳවුරක් පවත්වාගෙන යනවා කියලා. එතකොට ඔහු ඒ ප්‍රකාශය කළාට පස්සේ අපි දැක්කා ඒ පිළිබඳව විමර්ශනයක් කළා කියලා කැබිනට් මාධ්‍ය ප්‍රකාශක ප්‍රසිද්ධියේ කියනවා. එතන තියෙන්නේ එහෙම එල්.ටී.ටී.ඊ. කඳවුරක් නෙවෙයි, ගාමන්ට් එකක් සහ ගොවිපළක් කියලා. හැබැයි කැබිනට් මාධ්‍ය ප්‍රකාශකම පිළිගත්තා එතන රක්ෂිත භූමිය එළිපෙහෙළි කරලා තමයි මේ ඉදිකිරීම කරලා තියෙන්නේ කියලා. විටින් විට ආරක්ෂක අංශ විසින් පියවර අරන් තියෙනවා, අධිකරණ තහනම් නියෝගයක් තියෙනවා; නමුත් ඔහු ඒක පවත්වාගෙන යනවා කියන කාරණය පිළිගත්තා.

එතකොට එවැනි තත්ත්වයක් ඇතුළේ ඊට පසුව අපි දකින කාරණය තමයි ඔහු විසින් ජාතිවාදය ඇවිස්සුවා කියලා ඔහුව අත්අඩංගුවට ගන්නවා. හැබැයි අපි ප්‍රශ්න කරන්නේ, ඔය කාලසීමාවේදීම දෙමළ ජාතික ජනතා නියෝජිතයෙක් ප්‍රසිද්ධ මාධ්‍යයේ ප්‍රකාශයක් කරනවා දෙමළ ජනතාවගේ මළසිරුරු පන්සල් සහ හමුදා කඳවුරු තුළ වළදාලා තියෙනවා කියලා. හැබැයි අපි දකින්නේ නැහැ අර සංගීත් ජයසේකර මහත්තයා වෙනුවෙන් ගත්තු තීරණය එතනට ක්‍රියාත්මක වෙනවා. එතනදී අඩුම තරමේ අත්අඩංගුවට ගැනීමක් තියා ඔහුව ප්‍රශ්න කිරීමක්වත් කරන්න ආරක්ෂක අංශ ඉදිරිපත් වෙන්නේ නැහැ. මෙන්න මේ දෙබිඩි පිළිවෙත කුමක්ද කියන කාරණය අපි ප්‍රශ්න කරනවා. එතකොට සංගීත් ජයසේකරව අත්අඩංගුවට ගන්නේ ඔහු සිංහල ජාතිකයෙක් වීමත්, අර කියන පුද්ගලයාව අත්අඩංගුවට නොගන්නේ හෝ ප්‍රශ්න කිරීමක්වත් නොකරන්නේ ඔහු දෙමළ ජාතිකයෙකු වීම නිසාද කියන කාරණය අපි ප්‍රශ්න කරනවා.

එතකොට ඔන්න ඔහොම තමයි අපි දකින විදිහට මේ නීතිය අපේ රටේ ක්‍රියාත්මක වෙන්නේ. ඒ විතරක් නෙවෙයි, අපි දකිනවා මේ වෙනකොට මේ සියල්ල දිගහැරෙමින් තියෙන්නේ බෙදුම්වාදය පෝෂණය කරන දිශාවටයි. දැන් මේ කියපු කාරණා සියල්ල වගේම එක පැත්තකින් 22 වෙනි ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා

සංශෝධනය එනවා. ඒකේ එක වගන්තියක් මේගොල්ලෝ ඇතුළත් කරලා තියෙනවා 146 වගන්තිය සංශෝධනය කරන්න. ඒකේ තියෙන්නේ අභියාචනාධිකරණය පැහැදිලි වචනවලින්ම 'කොළඹ පිහිටුවලා තියෙන්න ඕන, කොළඹ විතරයි තියෙන්න ඕන' කියලා තියෙන එක පළාත් මට්ටමට කඩන්න, අභියාචනාධිකරණය පළාත් මට්ටමින් පිහිටුවන්න යෝජනා කරලා තියෙනවා. එතකොට මේකත් අවසානයේ බෙදුම්වාදී ඉල්ලීම් කරන අයට 'ස්වාධීන අධිකරණ තිබ්බා' කියලා පෙන්නාගන්න එක අවස්ථාවක් හැදෙනවා කියලයි අපි විශ්වාස කරන්නේ.

එතකොට මේ සියල්ල මෙහෙම වෙද්දී, අපේ රටේ ආණ්ඩුවේ බලධාරීන් දැනුවත්ව හෝ නොදැනුවත්ව (අපි නම් විශ්වාස කරන්නේ මේවා නොදැනුවත්ව නෙවෙයි වෙන්නේ) ඉතාම සූක්ෂ්මව යම් දිශානතියකට යොමුකරලා තියෙනවා. ඒ අතරේ සමහරු ඉදගෙන ජනතාවට විහිළු සපයනවා (ආතල් දෙනවා). අපිට කියන්න තියෙන වචනය ඒකයි.

විශේෂයෙන්ම අපි දන්නවා රටේ කෘෂිකර්ම ඇමතිවරයා ලාල් කාන්ත මහත්තයා ගත්තහම, එයා ගොවියන්ට විහිළු සපයනවා. එයා කියනවා "උඹලා පුළුවන් විදියට වවපල්ලා, එහෙම නැත්නම් අපි රටින් ගෙන්නනවා, අපි ආනයනය කරනවා; දැන් ‘‘අපි වවන්නේ අපි කන්නේ සංකල්පය’’ නැහැ, ‘‘පුරන් කුඹුරු අස්වද්දනවා’’ කියන ඒවා දැන් යල්පැන ගිය සංකල්ප" කියලා.

ඒ විතරකුත් නෙවෙයි, අධිකරණ ඇමතිතුමා රුදවියන්ගේ පවුල්වල අයට විහිළු සපයනවා. "කී දෙනෙක් මැරිලද, මොකක්ද තත්ත්වය?" කියලා ඇහුවහම එයා කියනවා "මට පැය දෙක-තුනකින් සමාජ මාධ්‍ය බලන්න බැරිවුණා, ඒ නිසා හරිම තොරතුරක් නැහැ, දහස් ගාණක් මැරිලා කියලා ආරංචියි" කියලා. එතකොට එයා ජනතාවට වෙනම ආතල් යවනවා.

ඒ විතරක් නෙවෙයි අධ්‍යාපන ඇමතිතුමිය; එතුමිය අධ්‍යාපන ප්‍රතිසංස්කරණ ඇතුළේ එකක් ගෙනාවා. ප්‍රගතිශීලීන්ගේ දැඩි බලපෑම් හමුවේ ඒක යම් තරමකට හකුලාගෙන තිබ්ලා, දැන් ආපහු ආරංචියි 2027දී නැවත ක්‍රියාත්මක කරන්න යනවා කියලා. දැන් ඒ අතරේ මේ ඊයේ පෙරේදා ආපහු වෙනම ආතල් එකක් දෙනවා... "පාසල් නිවාඩු කාලය දරුවන්ට නිවාඩුවක් විදිහට ගත කරන්න දෙන්න" කියලා. මේක කියන්නේ පාසල් නිවාඩු කාලයෙන් භාගයක් ගෙවුණට පස්සේ! එයා ඉල්ලීමක් කරනවා විදුහල්පතිවරුන්ගෙන්, කලාප අධ්‍යාපන අධ්‍යක්ෂවරුන්ගෙන් "පාසල් නිවාඩු කාලය ළමයින්ට නිවාඩුවක් විදිහට ගත කරන්න දෙන්න, දරුවෝ පාසලට කැඳවන්න එපා" කියලා. මොකද එයාගේ යටතේ තියෙන අධ්‍යාපන අමාත්‍යාංශයේ පාසල් පද්ධතියේ තමයි මේවා වෙන්නේ. විදුහල්පතිවරුන් විසින් ගුරුවරුන්ව සහ දරුවන්ව පාසලට කැඳවලා සම්මන්ත්‍රණ, ප්‍රතිපෝෂණ වැඩසටහන් ක්‍රියාත්මක කරනවා. එහෙම තියෙද්දී ඒ ටික වෙනම ආතල් එකක් දීලා අවසානයේ එයා කියනවා එහෙම කරන්න එපා කියලා.

ඒ අතරතුර වසන්ත සමරසිංහ වෙළඳ ඇමතිතුමා ඇවිල්ලා කෘෂිකර්ම අමාත්‍යාංශය ගැන තොරතුරු ප්‍රකාශයට පත්කරනවා. එයා දෙන්නේ වෙනම ආතල්... ඒ අතරේ අපේ ජනාධිපතිතුමා, 22 වෙනි සංශෝධනය ගැන නීතිඥ සංගමය විරෝධය පළ කරද්දී කියනවා "නැහැ ඒක ප්‍රශ්නයක් නැහැ, මම ඒ අභියෝගය භාරගන්න සූදානම්" කියලා. රටම විරුද්ධ වෙද්දී එයා 22 සම්මත කරගන්න ඒ අභියෝගය භාරගන්න සූදානම් කියනවා. ඒවා වෙනම වෙනම ආතල්.

එතකොට මෙන්න මේවා දිහා බලාගෙන ජනතාව ඉද්දී, සමහර වෙලාවට විපක්ෂ කඳවුරේ ජනතා නියෝජිතයන් මේවට පැටලෙද්දී, ජනාධිපතිතුමාගේ වචනවලින්ම කියනවා නම් "යටින් වැඩේ හෙමීට යනවා". යටින් හෙමීට යනවා කියන එක බොහොම පැහැදිලිව අපිට පේන්න තියෙනවා. ඒක නිසා අපි පැහැදිලිව මතක් කරන්න ඕන, මේගොල්ලෝ පහුගිය කාලේ විපක්ෂයේ ඉන්න කාලසීමාව ඇතුළේ ව්‍යාජ දේශප්‍රේමයක් මවමින් හිටියේ. එතකොට මේ ව්‍යාජ දේශප්‍රේමය සමහර විට දෙමළ ඩයස්පෝරාවට, එන්.ජී.ඕ. (NGO) නඩවලට, මේ රට සූරාගෙන කන්න බලාගෙන ඉන්න අධිරාජ්‍යවාදීන්ට යම් ආකාරයකට ප්‍රයෝජනවත් වුණා. ඒගොල්ලෝ කල්පනා කරා මේගොල්ලන්ට බලය අරන් දෙන්න. මේ සියලු දෙනාගේ මැදිහත්වීමෙන් තමයි මේ ගෝල්ලන්ට බලය අරන් දුන්නේ. දැන් "ඌරගේ මාළු ඌරගේ පිටේම තියලාම කපනවා."

එතකොට ප්‍රශ්නය තියෙන්නේ ඒක නෙවෙයි; අපේ රටේ ජනතාව හිතාගෙන ඉන්නවා, මේ ව්‍යාජ දේශප්‍රේමයට රැවටුණු ජනතාව තාම හිතාගෙන ඉන්නවා "මේගොල්ලෝ එහෙම වෙන්න බැහැ, මේගොල්ලෝ මෙතරම් ප්‍රගතිශීලීව, මෙතරම් දේශප්‍රේමීව තමයි විපක්ෂයේ ඉන්න කාලේ කතාබහ කළේ, ඒ නිසා මේ කියන ඒවා සමහර වෙලාවට විපක්ෂයේ අය අර හොරකම්වලින් බේරෙන්න කියන කතා වෙන්න ඇති" කියලා. ජනතාව එහෙම විශ්වාසයක ඉන්නවා. හැබැයි අපි ජනතාවට අවදි වෙන්න කියලා ඉල්ලීමක් කරනවා. මොකද මේගොල්ලන්ගේ සටන වුණේ අධිරාජ්‍ය විරෝධී සටන හරහා සමාජවාදය ගොඩනගන්න ගිය එක; ඉන්දියානු ව්‍යාප්තවාදය ගැන ඉතාම ගැඹුරෙන් සාකච්ඡා කරපු අය. එහෙම මහත්වරු දැන් ඒ සියලු දෙනාගේ සහයෝගය අරගෙන තමයි මේ බලය පවත්වාගෙන යන්නේ.

ඒක නිසා අපි කියනවා, මේක අවසානයේ ඉතියෝපියාවෙන් එරිත්‍රියාව වෙන් කළා වගේ වෙන්න පුළුවන්. අපිට පේනවා මේ දිශානතිය එතනට තමයි තල්ලුවෙමින් යන්නේ කියලා. ඉතියෝපියාවේ බෙදුම්වාදීන් කොටසක් අපේ රටේ වගේම වසර 30 ගණනාවක් යුද්ධ කළා වෙනම කොටසක් රටෙන් වෙන් කරගන්න. ඒ කාලේ ඉතියෝපියාව කියන රාජ්‍යයට අවශ්‍ය ආයුධ සහ ආර්ථික බලය දුන්නේ සෝවියට් දේශය. හැබැයි සෝවියට් දේශය බිඳවැටෙනවා 1991දී. ඒ බිඳවැටීමෙන් පස්සේ ඉතියෝපියාව ආර්ථික වශයෙන් සහ යුධ බලයෙන් අඩපණ වෙනවා. අන්න ඒ කාලසීමාවේ එක්සත් ජාතීන්ගේ සහ බටහිර රටවල මැදිහත්වීමෙන් ඔය කියන එරිත්‍රියාව තුළ පවත්වපු ජනමත විචාරණයකින් අවසානයේ ඉතියෝපියාවෙන් එරිත්‍රියාව වෙන් කරලා වෙනම රාජ්‍යයක් බවට පත් කරන්න කටයුතු කරනවා.

ඉතින් ඒක නිසා අපි කියනවා අපේ රටේ ජනතාවට, අපේ රටේ විද්වතුන්ට, දේශපාලන වශයෙන් උනන්දු වෙන මේ සියලු දෙනාට මෙන්න මේ ඉතියෝපියාවෙන් එරිත්‍රියාව වෙන්වුණු ආකාරය පිළිබඳව අධ්‍යයනය කරන්න කියලා. එහෙම අධ්‍යයනය කරලා "අපි යන්නෙත් ඒ දිශානතියටම නේද?" කියන කාරණය පැහැදිලි කරගන්න. එහෙම පැහැදිලි කරගෙන මේකට එරෙහිව අවශ්‍ය බලය ගොඩනගන්න මැදිහත් වෙන්න කියලා ඉල්ලීමක් කරනවා. බොහොම ස්තූතියි.”

මාධ්‍යවේදියාගේ ප්‍රශ්නය:

"දැන් ඔබතුමාලා ජාතිවාදය උස්සලා බලය ගන්න උත්සාහ කරනවා කියලා ආණ්ඩුව කියනවා. ආණ්ඩුව කරන්නේ එතකොට වෙන තැනකින් බලය ගන්න උත්සාහ කිරීමක්ද?"

සඳුන් බණ්ඩාර මහතාගේ පිළිතුර:

"ඔව්, දැන් අපිට පේන විදියට නම් ආණ්ඩුව කළේ අධිරාජ්‍යවාදීන්ගේ සහ දෙමළ ඩයස්පෝරාවේ සහයෝගය අරගෙන බලය ගත්තු එකයි. හැබැයි දැන් අද වෙනකොට රට තුළ ඔවුන් පිළිබඳ විශ්වාසය බිඳවැටෙමින් තියෙනවා. ඒගොල්ලෝ මේ බලය පවත්වාගෙන යෑම සඳහා ඔය කියන දෙමළ ඩයස්පෝරාවේ, එන්.ජී.ඕ. නඩවල, අධිරාජ්‍යවාදීන්ගේ ඕනෑ එපාකම් ඉටු කරමින් බලය රඳවාගන්න උත්සාහ දරන ආකාරයක් තමයි අපි දකින්නේ."

මාධ්‍යවේදියාගේ ප්‍රශ්නය:

"දැන් ආණ්ඩුව නම් කියන්නේ මේ 22 වෙනි සංශෝධනය ඉතාම සද්භාවයෙන් ගෙනාවේ කියලා. කිසිම විදියකින් අධිකරණයට බලපෑමක් කිරීමක් නෙවෙයි, ප්‍රමාද වෙලා තියෙන නඩු ඉක්මන් කරලා අවසන් කරන්නයි මේක කරන්නේ කියලා. දැන් ඕගොල්ලෝ එතකොට ඒක ප්‍රතික්ෂේප කරනවද?"

සඳුන් බණ්ඩාර මහතාගේ පිළිතුර:

"ඔව්, දැන් ඔය 22 වැනි ව්‍යවස්ථා සංශෝධනය හරහා ඒගොල්ලෝ කියන්නේ ශ්‍රේෂ්ඨාධිකරණ විනිසුරුවරුන්ගේ විශ්‍රාම වයස් සීමාව වසර දෙකකින් දීර්ඝ කරනවා කියන කාරණයයි. අපි අහන්න කැමතියි—ඒගොල්ලෝ එක වෙලාවක ප්‍රශ්න කරනවා අපි දැක්කා ලක්මාලි මන්ත්‍රීතුමිය එහෙම දිගින් දිගටම කියනවා 'විපක්ෂයේ අය කියන්නේ නැහැ කොහොමද මේ 22 නිසා අධිකරණයේ ස්වාධීනත්වය නැති වෙන්නේ' කියලා. අපි අහනවා, ඔයාලගේ තර්කය විදිහට ආණ්ඩුව කියනවා නම් 22 ගෙනල්ලා

හදන්නේ නඩු ඉක්මන් කරන්න කියලා, ඒක වෙන්නේ කොහොමද කියලා ආණ්ඩුව පැත්තෙන් පැහැදිලි කරන්න කියලා.

මොකද ඔය වසර දෙකකින් විනිසුරුවරුන්ගේ වයස් සීමාව දීර්ඝ කිරීම මගින් විතරක් කොහොමද රටේ තියෙන නඩු ටික ඉක්මන් වෙන්නේ? එතකොට ඔය පුටුවල වෙන අය වාඩි වුණොත් ඔය නඩු කරන්නේ නැද්ද? අපිට තියෙන ප්‍රශ්නය ඒකයි.

එහෙම නැත්නම් අපි හිතමු අගවිනිසුරුතුමා කියලා. දැන් මූලිකවම මේ කාරණාවේදී ආවේ අගවිනිසුරුගේ වයස් සීමාව දීර්ඝ කිරීමයි. ඊට පස්සේ තමයි මේ කතාබහ හොඳ නැති වෙනකොට, එක් පුද්ගලයෙක් සම්බන්ධයෙන් විතරක් චෝදනාව එනකොට මේක උපරිමාධිකරණ විනිසුරුවරුන්ට ගියේ. මේක තවදුරටත් පුළුල් වෙනකොට, මහේස්ත්‍රාත්වරුන් සහ දිසා විනිසුරුවරුන් මේකට විරුද්ධ වෙනකොට, අන්න දැන් අධිකරණ සේවා කොමිෂන් සභා පනතත් සංශෝධනය කරලා ඔවුන්ගෙත් විශ්‍රාම වයස් සීමාව වැඩි කරන්න ගියේ. එතකොට එහෙමනේ මේක වුණේ.

එතකොට අපි අහනවා දැන් අගවිනිසුරුතුමාව ඔහොම තියාගන්න ඕන නම්, මේ අගවිනිසුරුතුමා යටතේම නම් මේ නඩු ටික ගොඩදාන්න පුළුවන් වෙන්නේ—අපි එහෙම වෙන්න කියලා ප්‍රාර්ථනා කරන්නේ නැහැ, අපි තර්කයක් විදිහට අහන්නේ—හදිසියේ හරි මේ අගවිනිසුරුතුමාගේ ජීවිතය නැති වුණොත් එහෙම, කොහොමද ඔය නඩු ටික කරන්නේ? එතකොට ඔය නඩු ටිකට මොකද වෙන්නේ? ඔය නඩු ටික ඔය විදියටම හිරවෙනවද? අර කියන හොරු ටික හිරේ දාන්න බැරිවෙනවද? එතකොට මේවට උත්තරයක් රජය පැත්තෙන් ඕන.

අපිට ආරංචි විදිහට ජනතා විමුක්ති පෙරමුණේ, ඔය කියන මාලිමාවේ දේශපාලන මණ්ඩලය ඇතුළෙත් මේ ගැන විශාල තර්ක විතර්ක තියෙනවා. අපි දන්නවා බිමල් රත්නායක ඇතුළු පිරිසක් මේ වෙනකොට ප්‍රකාශ කරලා තියෙනවා 'මේක හකුලාගන්න, මේකට රටම විරුද්ධයි' කියලා. හැබැයි ජනාධිපතිතුමාගේ පැත්තෙන් එයාට වෙන ප්‍රශ්නයක් තියෙනවා; එතුමා මේක වෙනුවෙන් දැන් බෙල්ල තියපු නිසා මේක හකුලාගැනීමේ ප්‍රශ්නයක් එයාට තියෙනවා. එතකොට ඒ වෙනුවෙන් තමයි අපි විශ්වාස කරන්නේ ලබන සැප්තැම්බර් 05 වෙනිදා ඉඳලා රට පුරා ජනරැලි මාලාවක් ආරම්භ කරලා තියෙන්නේ මේක ජනතාවට පැහැදිලි කරන්න කියන අරමුණෙන්.

කෙසේ වෙතත් අපි අහනවා, මේගොල්ලෝ කියන්නේ 'රටම විරුද්ධයි' කියලා අපි කිව්වහම එයාලා කියනවා 'නැහැ රටේ එහෙම විරෝධයක් නැහැ, මේ නීතිඥවරු කිහිපදෙනෙක්, සුළු පිරිසක්, විපක්ෂයේ

ඇප පිට සහ සැකපිට ඉන්න මිනිස්සු ටික තමයි මේකට විරුද්ධ' කියලා. ඉතින් අපි අහනවා එහෙම නම් මෙච්චර තර්ක විතර්ක ඕනේ නැහැනේ; රටම කැමති නම් ජනමත විචාරණයකින් මේක තහවුරු කරගත්තහම කාටවත් ප්‍රශ්නයක් නැහැ. ඕක තමයි ඔය ඉදිරිපත් කරපු පෙත්සම්වලිනුත් කියන්නේ.

පෙත්සම්වලින් කියන්නේ පූර්ණ විනිසුරු මඬුල්ලකට (Full Bench) යන්න, නැත්නම් ශ්‍රේෂ්ඨාධිකරණයේ විනිසුරුවරුන් 13 දෙනාගෙම මඬුල්ලකින් මේක විභාග කරන්න කියලා. ඒ වගේම අනිත් පැත්තෙන් ඉල්ලීමක් තියෙනවා මේක ජනමත විචාරණයකට ගිහිල්ලා ජනතාවගෙන් අහන්න කියලා. ඉතින් එහෙම කළාම ඉවරයිනේ! ආණ්ඩුවටත් එහෙම ප්‍රශ්නයක් නැත්නම්, ජනමත විචාරණයකට යාමේ හැකියාව තියෙනවා.

බොහොම ස්තූතියි."